විශේෂාංග

# එක්නැලිගොඩ! සිදුවූයේ කුමක්ද?



මාධ්‍යවේදී ප්‍රදීප් එක්නැලිගොඩගේ දයාබර බිරිඳ පසුගිය දිනක මාධ්‍ය හමුවේ පෙනී සිටියාය. එහිදී ඇය ජනාධිපතිවරයාගෙන් මෙන්ම අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටියේ තම සැමියාට යුක්තිය ඉෂ්ට කර දෙන ලෙසයි.

වසර පහක් තිස්සේ ඇය සිය සැමියා වෙනුවෙන් සටන් කළාය. ඇයට හඬන්නට තවත් කඳුළු ඉතිරිව නැත. විලාප තඟන්නට ද ඇයට ශක්තියක් නැත.

වසර පහකට අධික කාලයක් තිස්සේ අබිරහසක්ව තිබූ එක්නැලිගොඩ අතුරුදන්වීම මේ වන විට හෙළිදරව් වී හමාරය. එක්නැලිගොඩ තවදුරටත් අතුරුදන්ව නැත. කෲර පාලකයන් විසින් ඔහු සහතික ලෙස ඝාතනය කර ඇති බව සාක්ෂි සහිතව ඔප්පු වී තිබේ.

ප්‍රදීප් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීම දේශපාලන අවශ්‍යතාවක් මත සිදුවූවක් බව නොරහසකි. පසුගිය රාජ්‍ය පාලන සමයේ ආරක්ෂක අංශවල අවශ්‍යතාව මත මේ සියල්ල සිදුවූ බව මේ වන විට හෙළිදරව් වී හමාරය.

එක්නැලිගොඩ මේ පාලකයන්ගේ උදහසට ලක්වන්නේ නොබියව සිය රාජකාරිය ඉටුකිරීම නිසාය. ලංකා ඊ නිවුස් වෙබ් අඩවිය ඔස්සේ ඔහු පසුගිය රජයේ විවිධ දූෂිත ක්‍රියා මෙන්ම දූෂිතයන් පිළිබඳව හෙළිකළේය. ඔවුන් තදින් විවේචනය කළේය.

ඉන් නොනැවතුණු එක්නැලිගොඩ පසුගිය රජය සමයේ මුළු රටම වෙළාගෙන තිබූ පවුල් පාලනයක් පිළිබඳව කියෑවෙන සඟරාවක් නිර්මාණය කළේය.

ප්‍රදීප් එක්නැලිගොඩ හිටපු හමුදාපති ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා සමීපව ඇසුරු කළේය. ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා රාජ උදහසට ලක්වෙන කාල සීමාව වන විටද ප්‍රදීප් එක්නැලිගොඩ ඔහු සමඟ සමීපව කටයුතු කරමින් දේශපාලන වැඩවලටද උදව් උපකාර කරමින් සිටියේය.

එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීමට ආසන්නතම හේතුව වන්නේ පවුල් ගස සඟරාව නිර්මාණය කිරීම බවට කට කතා පැතිර තිබිණි.

එක්නැලිගොඩ ඝාතනය කිරීමේ කොන්ත්‍රාත්තුව යුද හමුදා බුද්ධි අංශයේ දූෂිත නිලධාරීන් කණ්ඩායමක් වෙත භාර කෙරෙන්නේ එවකට ආරක්ෂක අංශවලට නායකත්වය දුන් බලවතකු විසින් යයිද කියතු ලැබේ.

ඒ වන විටත් බුද්ධි අංශ එක්නැලිගොඩ පසුපස ලුහුබඳිමින් සිටියහ.

එක්නැලිගොඩ කොටුකර ගැනීමේ මෙහෙයුමේ ප්‍රධාන චරිතයකට පණපෙව්වේ හිටපු සුමතිපාල සුරේෂ් නමැති එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකි. බුද්ධි අංශ මේ කාර්ය සඳහා සුමතිපාල සුරේෂ් යොදා ගත්තේ හොර රහසේය.

සුරේෂ් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රබල චරිතයක් විය. එල්.ටී.ටී.ඊ. ය ඔහු හැඳින්වූයේ තවේන්ද්‍රන් යන නමින්ය. තවේන්ද්‍රන්ට වයස අවුරුදු 16 දී ඔහුගේ මව මිය යන්නේ ගුවන් හමුදාව එල්ල කළ ප්‍රහාරයකින්ය. ඊට වසර කීපයකට පසු යුද හමුදා ප්‍රහාරයකින් තවේන්ද්‍රන්ගේ පියාද මියගියේය.

මේ සියලු සිදුවීම් හමුවේ සමස්ත සිංහල ජාතිය කෙරෙහිම දැඩි වෛරයකින් පසුවූ තවේන්ද්‍රන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට ස්ව කැමැත්තෙන්ම බැඳෙන්නේය.

අවි ආයුධ පුහුණුව මෙන්ම බුද්ධි අංශ පුහුණුවද හොඳින් ප්‍රගුණ කළ තවේන්ද්‍රන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස වසර ගණනාවක් කටයුතු කළේය. ප්‍රහාර ගණනාවකටම එක් වුණේය.

පසු කලෙක ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී ජොනි බටටකු පෑගීමෙන් ඔහුගේ වම් පාදයේ කොටසක් අහිමි විය.

එතැන් සිට එල්.ටී.ටී.ඊ. සන්නද්ධ අංශයෙන් ඉවත් වූ තවේන්ද්‍රන් දේශපාලන අංශයට බැඳුණේය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දේශපාලන අංශ නායකයා ලෙස කටයුතු කළේ තවේන්ද්‍රන්ය.

තම ජීවිත කතාව ඉතාම සංවේදී ලෙස ප්‍රකාශ කරමින් දෙමළ තරුණයන් එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙත නම්මවා ගැනීමේ මනා හැකියාවක් තවේන්ද්‍රන් සතුවිය. ඒ අතර කොටි බුද්ධි අංශයට ද සම්බන්ධ වූ තවේන්ද්‍රන් පොට්ටුඅම්මාන් සමග ද සමීපව කටයුතු කළේය.

2002 වර්ෂයේදී එල්.ටී.ටී.ඊ. ය සහ එවකට එජාප රජය අතර පැවැති සාම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ජනතාවට උතුරේ සංචාරයට ඉඩකඩ ලැබී තිබුණේය.

එවකට රජයේ ඇමැතිවරයකුව සිටි නැසී ගිය දොස්තර ජයලත් ජයවර්ධන දිනක් මඩු දේවස්ථානය වෙත පැමිණ සිටියේය. ඔහු පැමිණ සිටියේ ප්‍රදීප් එක්නැලිගොඩ ද සමගය. සෙල්වම් අඩෛක්කලනාදන් ද ඒ සමඟ සිටියේය.

එදින තවේන්ද්‍රන් ද මඩු දේවස්ථානය වෙත පැමිණ සිටියේය. තවේන්ද්‍රන් ප්‍රදීප් එක්නැලිගොඩට හඳුන්වා දුන්නේ අඩෛක්කලනාදන් විසින්ය.

එක්නැලිගොඩ ජාත්‍යන්තර සම්බන්ධතා ඇති මාධ්‍යවේදියකු බවත් ඔහු සමඟ සම්බන්ධතා පැවැත්වීම වැදගත් බවත් අඩෛක්කලනාදන් තවේන්ද්‍රන්ට කියා තිබුණේය.

මේ දැන හඳුනාගැනීම ඉතාම කෙටි කාලයක් තුළ සමීප සම්බන්ධතාවක් දක්වා දුරදිග ගියේය. සතියකට දෙතුන් වතාවක් එක්නැලිගොඩ තවේන්ද්‍රන්ට දුරකථනයෙන් කතා කළේය. කොටි පාලන ප්‍රදේශවල වැදගත් තොරතුරු සියල්ල එක්නැලිගොඩ ලබාගත්තේ තවේන්ද්‍රන්ගේ මාර්ගයෙන්ය.

එල්.ටී.ටී.ඊ. සංවිධානය යුදමය අතින් පරාජයට පත් වීමෙන් පසු 2009 වර්ෂයේදී තවේන්ද්‍රන් යුද හමුදාවට භාර වුණේය. පසුව ඔහු පුනරුත්ථාපනය කෙරුණේය. පුනරුත්ථාපනය කිරීමෙන් පසු තවේන්ද්‍රන් යුද හමුදා බුද්ධි අංශය වෙත බඳවා ගන්නේ ඔහු හරහා විශාල මෙහෙවරක් ලබා ගැනීමේ අරමුණු ඇතිවය.

සැඟවී සිටින කොටි ත්‍රස්තවාදීන් සොයා දීමට ඔහු කටයුතු කළේය. එමෙන්ම කොටින් සතුව තිබූ අවි ආයුධ තොග සොයා දීම කොටින්ගේ සැලසුම් පිළිබඳව බුද්ධි අංශ වෙත වැදගත් තොරතුරු දීම තවේන්ද්‍රන් විසින් සිදුකළේය.

තවේන්ද්‍රන් යුද හමුදාවට භාරවී පුනරුත්ථාපනය වූ බව එක්නැලිගොඩ දැන සිටියේ නැත. තමන් යුද හමුදා බුද්ධි අංශයට සම්බන්ධ වී සිටින බවද එක්නැලිගොඩට නොපැවසීමට තවේන්ද්‍රන් වගබලා ගත්තේය.

එක්නැලිගොඩ දිගින් දිගටම තවේන්ද්‍රන් සමඟ සබඳතා පවත්වමින් ඔහුට දුරකථනයෙන් කතා කළේය.

මේ අතර තවේන්ද්‍රන් සමඟ සම්බන්ධතා පැවැත් වූ හමුදා සාමාජිකයන් සහ සිවිල් පුද්ගලයන් පිළිබඳව ද බුද්ධි අංශ සොයන්නට වූහ.

ප්‍රදීප් එක්නැලිගොඩ තමන් සමඟ දීර්ඝ කාලයක සිට සම්බන්ධතා පවත්වන බව තවේන්ද්‍රන් බුද්ධි අංශ වෙත කියා සිටියේය.

ඒ වන විට හිටපු හමුදාපති සරත් ෙµdන්සේකා රජය සමඟ විරසක වී සිටි අතර ඔහු සමඟ සබඳතා පැවැත් වූවත් පිළිබඳවද බුද්ධි අංශවල දැඩි අවධානය යොමුව තිබුණේය.

එක්නැලිගොඩ පිළිබඳව ඇස ගසාගෙන සිටින ලෙස බුද්ධි අංශ තවේන්ද්‍රන්ට උපදෙස් දුන්නේ මේ නිසාය.

එක්නැලිගොඩ සිය ග්‍රහණයට ගැනීම සඳහා බුද්ධි අංශයේ දූෂිත නිලධාරීන් පිරිසක් සැලසුම් සකස් කරන්නට වූහ.

දෙමළ භාෂාව හොඳින් හැසිරවිය හැකි ප්‍රියන්ත නමැති බුද්ධි අංශයේම සොල්දාදුවකු ඒ සඳහා යොදා ගත්තේය. ප්‍රියන්ත නමැති සොල්දාදුවා තාදන් නමැති එල්.ටී.ටී.ඊ. සාමාජිකයකු ලෙස වෙස්ගැන්වූ බුද්ධි අංශය තවේන්ද්‍රන් මාර්ගයෙන් ඔහු එක්නැලිගොඩට හඳුන්වා දුන්නේය.

එක්නැලිගොඩට අයත් පුංචි ඉඩම් කට්ටියක් සීගිරිය ප්‍රදේශයේ පිහිටා තිබුණේය.

තාදන් ලෙස වෙස්වලාගත් කෝප්‍රල් වරයෙක් බුද්ධි අංශ සාමාජිකයන් පිරිසක්ද සමඟ සීගිරියේ පිහිටි ඉඩමේදී එක්නැලිගොඩ මුණගැසුණේය. ඒ 2009 වර්ෂයේ නොවැම්බර් මාසයේ දිනකදීය. මේ හමුවීම සිදුවන්නේ තවේන්ද්‍රන්ගේ මැදිහත්වීම මතය.

එදින තවේන්ද්‍රන් එක්නැලිගොඩට කියා සිටියේ තමන්ට විදේශ ගතවීමට අවශ්‍ය බවය. ඒ සඳහා විදේශ ගමන් බලපත්‍රයක් සකස් කර ගැනීමට උපකාර කරන ලෙසද ඔහු කියා සිටියේය.

අදාළ ලියකියවිලි සහ මුදල් ලබා දුන්නොත් ඒ කාර්ය කරදීමට හැකි බව එදින එක්නැලිගොඩ කීවේය.

තවේන්ද්‍රන් එක්නැලිගොඩට දුර කථනයෙන් කතාකර තාදන් අත විදේශ ගමන් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි එවන බව කියා සිටියේ ඔහු පැහැර ගැනීමට අඩිතාලම දමමින්ය.

ඒ අනුව එක්නැලිගොඩ මුණගැසීමට තාදන් අතුරුගිරියට ආවේය. ඔහු සමඟ යුද හමුදා බුද්ධි අංශයේ ලුතිනන් කර්නල්වරයකු මෙන්ම තවත් සාමාජිකයන් පිරිසක්ද පැමිණ සිටියහ.

රාත්‍රී 7.30 ට පමණ එක්නැලිගොඩ මුණගැසුණු තාදන් ඔහුද කැටිව සීගිරියට යන්නේ වෑන් රථයකින්ය.

එහෙත් ඒ ගමන කෙළවර වන්නේ ගිරිතලේ හමුදා කඳවුරෙන්ය. ඒ ගිරිතලේ කඳවුරට එක්නැළිගොඩ බාරදීමෙනි. 2010 ජනවාරි 25, 26, 27 දින තුන පුරා එක්නැලිගොඩ ගිරිතලේ කඳවුරේ රඳවාගෙන ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී.

ඒ ප්‍රශ්න කිරීම්වලට ප්‍රධාන මාතෘකාව වී තිබුණේ එක්නැලිගොඩ රචනා කළ පවුල් ගහ නමැති සඟරාව පිළිබඳවය. එමෙන්ම ඔහු විසින් අඳින ලද එවකට පාලකයන් විවේචනය කළ කාටූන් චිත්‍ර පොත් පිළිබඳවද දිගින් දිගටම ප්‍රශ්න කළේය.

එක්නැලිගොඩ එල්.ටී.ටී.ඊ. ය සමඟ සබඳතා පැවැත් වූවේද යන්න පිළිබඳව කොයිම අවස්ථාවකදීවත් ප්‍රශ්න කළේ නැත.

ඉහළින් නියෝග ලැබී තිබුණේ එක්නැලිගොඩ රචනා කළ පවුල් ගහ සඟරාව පිළිබඳව මෙන්ම එය රචනා කිරීමට උදව් උපකාර කළ අය පිළිබඳව තොරතුරු ලබාගැනීමට පමණය.

දින තුනක කාලයක් ගිරිතලේ කඳවුරේ රඳවාගෙන සිටි එක්නැලිගොඩ නැවත බුද්ධි අංශ ලුතිනන් කර්නල්වරයකු යටතට භාර කෙරෙන්නේය.

මේ කර්නල්වරයා කියා තිබුණේ එක්නැලිගොඩගෙන් තවදුරටත් ප්‍රශ්න කිරීමට ඔහු රැගෙන යන බවත්ය.

එහෙත් එතැන් සිට එක්නැලිගොඩ පිළිබඳව කිසිදු තොරතුරක් නොමැත. එක්නැලිගොඩ අවසන්වරට රැගෙන ගිය ලුතිතන් කර්නල්වරයා මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටියි.

ඔහු පවසන්නේ එක්නැලිගොඩ හමුදා බාරයේ භාරයේ සිටියදී පලාගොස් ඇති බවයි.

2010 වර්ෂයේ ජනවාරි 23 වැනිදා එක්නැලිගොඩ පැහැරගෙන යැමෙන් පසු ඔහුගේ බිරිඳ හෝමාගම පොලිසියේ මේ පිළිබඳව පැමිණිල්ලක් කළාය. එක්නැලිගොඩ අතුරුදන්වීම පිළිබඳව මුළු රටේම ප්‍රධාන මාතෘකාවක් බවට පත්වන්නේ එතැන් සිටය. එවකට රජය මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට මිරිහාන විශේෂ විමර්ශන ඒකකය සහ කොළඹ අපරාධ කොට්ඨාසය වෙත භාර කළේය.

එහෙත් ඒ පරීක්ෂණ තිකම්ම තිකන් පුස්සක් බවට පත්ව තිබුණේය. එක්නැලිගොඩගේ බිරිඳ සැබවින්ම යකඩ ගැහැනියකි. ඈය සිය සැමියා වෙනුවෙන් දැවැන්ත සටනක් ගෙන ගියේ එවකට සිටි පාලකයන්ට එරෙහිවය. මේ සටන් ජාත්‍යන්තරය දක්වාම ගෙන යැමට ඈය කටයුතු කළාය.

ප්‍රදීප් එක්නැලිගොඩ අතුරුදන් වී ගතවූ පස් වසරක කාලය පුරාවට එවකට රජය කිසිදු සාධාරණ පරීක්ෂණයක් පැවැත්වූයේ නැත. එක්නැලිගොඩට සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලමින් මොන තරම් උද්ඝෝෂණ කළද කත්තලව් කළද ඒවා බිහිරි අලීන්ට වීණා වාදනය කිරීමක් බඳු විය.

එක්නැලිගොඩගේ අතුරුදන්වීම සොයනවා වෙනුවට එවකට රජය කළේ ඔහු ඕනෑකමින් අතුරුදන්වී සිටින බවට ඒත්තු ගැන්වීමටය. ඒ සඳහා එවකට ආණ්ඩුවට වන්දිභට්ටකම් කළවුන් කීප දෙනකුම යොදා ගත්තේය. මේ වන්දි භට්ටයන් පුන පුනා කියා සිටියේ එක්නැලිගොඩ ජීවතුන් අතර සිටින බවය.

ප්‍රදීප් එක්නැලිගොඩ තමන්ට ප්‍රංශයේදී මුණගැසුණු බව එවකට පාර්ලිමේන්තු මන්ත්‍රී අරුන්දික ප්‍රනාන්දු කියා සිටියේය. හිටපු අගවිනිසුරු මොහාන් පීරිස් ප්‍රකාශ කර තිබුණේද ප්‍රදීප් එක්නැලිගොඩ විදේශ රටක ජීවත්වන බවයි.

මේ ප්‍රකාශවලින් ඔවුන් උත්සාහ කළේ දිගින් දිගටම එල්ලවන චෝදනාවලින් හිටපු රජය ආරක්ෂා කර ගැනීමය.

ඕනෑම අපරාධයක් සදාකාලිකව යටපත් කර දැමිය නොහැක. කෙදිනක හෝ සත්‍ය හෙළිවනු ඇත. රාජපක්ෂ රජය පරාජයට පත්වීමත් සමඟම සියල්ල කණපිට පෙරළෙන්නට පටන් ගත්තේය.

ඉකුත් ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ධුරයට පත්වීමත් සමඟම වැළලී ගිය මහා අපරාධ පිළිබඳව විමර්ශන එකින් එක කරළියට එන්නට පටන් ගත්තේය.

එක්නැලිගොඩ අතුරුදන්වීම පිළිබඳව විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන්නේ ජනවාරි 11 වැනිදාය.

එක්නැලිගොඩ අතුරුදන්වීමේ සුලමුල සෙවීමේ භාරදූර කාර්ය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දක්ෂ නිර්භීත නිලධාරීන් පිරිසක් වෙත භාර කෙරෙන්නේය.

එක්නැලිගොඩ පරිහරණය කරන ලද ජංගම දුරකථන ඔස්සේ කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස නාදන් ලෙස පෙනී සිටි කෝප්‍රල්වරයා අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමත් වූවේය. පසුව සුරේෂ් නොහොත් තවේන්ද්‍රන්ද පොලිස් භාරයට ගැනීමට හැකිවිය.

කුරුණෑගල වාරියපොල ප්‍රදේශයේදී සාජන් මේජර් රත්බණ්ඩා අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කළේය. ඒ වන විට රත්බණ්ඩා විශ්‍රාම ගොස් පොල් ඉඩමක් වගා කරමින් වාරියපොළට වී සිටියේය.

මේ සැකකරුවන් තිදෙනාගෙන් ප්‍රශ්න කිරීමේදී එක්නැලිගොඩගේ අතුරුදන්වීම පිළිබඳව මෙන්ම ඔහුට අත්වූ ඉරණම පිළිබඳවද හෙළිකර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හැකි විය.

එක්නැලිගොඩ පැහැර ගැනීමේ මෙහෙයුමට නායකත්වය දුන් ගිරිතලේ කඳවුරේ එවකට ප්‍රධානීන් ලෙස කටයුතු කළ ලුතිනන් කර්නල්වරුන් දෙදෙනා ඇතුළු හමුදා සාමාජිකයන් සිවුදෙනා වහාම තමන් වෙත භාර කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යුද හමුදාවට දැනුම් දුන්නේ පසුගිය 16 වැනිදාය.

එහෙත් ඔවුන් පොලිසියට භාර කිරීමට කටයුතු කළේ නැත. ඒ වෙනුවට ආරක්ෂක අංශ ප්‍රධානීන් කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හැකි තරම් බලපෑම් කිරීමය.

එක්නැලිගොඩගේ බිරිඳ හමුවීමට ගොස් මේ ප්‍රශ්නය දුරදිග ගෙන යැමෙන් වළකින ලෙස කියමින් ඇයට වක්‍රාකාරව තර්ජනය කිරීමට ද පිරිසක් උත්සාහ කළේය.

මේ බලපෑම් හමුවේ නොසැලී සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පසුගිය 20 වැනිදා සහ 22 වැනිදා නැවත නැවතත් යුද හමුදා ප්‍රධානීන් වෙත ලිතව දැනුම් දුන්නේ සැකකරුවන්ව තමන් වෙත වහාම භාර කරන ලෙසය.

එහෙත් ඒ සියල්ල ව්‍යර්ථවීමෙන් පසු සැකකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර කරන්නේ 24 වැනිදාය. හමුදා බලධාරීන් එදින සැලසුම් කළේ සැකකාර නිලධාරීන් පොලිසිය හමුවට ඉදිරිපත් කර එදිනම ඔවුන් නැවත රැගෙන යැමටය.

එහෙත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කනෙන් රිංගා යැමට ඔවුන්ට ඉඩ ලැබුණේ නැත.

එක්නැලිගොඩ ඝාතනයට සම්බන්ධ දූෂිත බුද්ධි නිලධාරීන්ගේ පැටිකිරිය මේ වන විට හෙළිවී හමාරය. සැකකාර හමුදා නිලධාරීන් මාස 3 ක කාල සීමාවකට රඳවාගෙන ප්‍රශ්න කිරීමට අවසර ඉල්ලා සිටියද ඒ සඳහා අවසර ලැබෙන්නේ දින 14 කට පමණය.

මේ අපරාධකාරයන් ආරක්ෂා කිරීමට ඉව අල්ලන බලධාරීන් තවමත් හොල්මන් කරමින් සිටීම විමතියට කරුණකි.

යුද හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් කිහිප දෙනෙකු නිසා සමස්ත බුද්ධි අංශයම නිගාවට පත්වෙමින් තිබිණි.

තිස්වසරක කුරිරු යුද්ධය හමාර කිරීමට යුද හමුදා බුද්ධි අංශ කළ අනුපමේය සේවය ඉතිහාස ගතවෙයි. යුද හමුදා බුද්ධි අංශ නිලධාරීන් ඒ කළ මහා කැපකිරීමට උදාර සේවයට පිං සිදුවන්නට මහා ව්‍යසනයන්ගෙන් රට ආරක්ෂා කර ගැනීමට හැකි වුණේය.

එහෙත් යුද හමුදා බුද්ධි අංශයේ කීර්තිනාමය ගෞරවය විනාශ කළ පිරිසක් ඊට අනුයුක්තව සිටීම කනගාටුවට කරුණකි. බුද්ධි අංශ හරහා තමන්ට ලැබුණු වරදාන වරප්‍රසාද රැකවරණ බලතල ප්‍රයෝජනයට ගත් මේ පිරිස පසුගිය වසර හත අටක කාලය පුරාවට කළ කී දෑ මේ වන විට හෙළිවෙමින් තිබෙයි.

යුද හමුදා බුද්ධි අංශයේ කීර්තිනාමය උකසට තබමින් කෝටිපතියන් වූ බුද්ධි නිලධාරීන් පිළිබඳ සියලු තොරතුරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සතුය.

එක්නැලිගොඩ ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවේ සිටින හමුදා සාමාජිකයන් සුපිරි ධනවතුන් වූයේ කෙසේද? ඒ අතර සිටින ලුතිනන් කර්නල්වරයකු අසීමිතව මුදල් උපයා ගත්තේ කෙසේද?

අතුරුගිරිය ප්‍රදේශයේ ඔහු ඉදිකළ තුන්මහල් මන්දිරයකි. පිහිනුම් තටාක ඇතුළු නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත වූ නිවස සඳහා වැයවී ඇති මුදල රුපියල් කෝටි ගණනකි. රජයේ මාසික

වැටුපක් ලබන ලුතිනන් කර්නල්වරයකු මේ ආකාරයට සුපිරි ධනවතකු බවට පත්වීම ගැටලුසහගතය.

එක්නැලිගොඩ ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවේ සිටින හමුදා සාමාජිකයන් විසින් දෙමළ ව්‍යාපාරිකයන් පැහැරගෙන ගොස් කප්පම් ගැනීම ඇතුළු තවත් අපරාධ රැසක් සිදුකර ඇති බව අනාවරණය වෙමින් තිබේ.

පිටකොටුවේ, වැල්ලවත්තේ, කොටහේනේ පදිංචි ධනවත් දෙමළ ව්‍යාපාරිකයන් පැහැරගෙන ගොස් ගිරිතලේ කඳවුරේ සිරකර ගෙන ඔවුන්ගෙන් රුපියල් කෝටි ගණනින් කප්පම් ලබාගෙන ඇත්තේ පසුගිය රජයේ දේශපාලන බලවතකු සහ ආරක්ෂක අංශ ප්‍රධානීන් කිහිප දෙනකුගේද අනුදැනුම මත බව අනාවරණය වෙමින් තිබෙන්නේය.

පසුගිය රාජ්‍ය පාලන සමයේ සිදුවූ මහා ආන්දොaලනාත්මක අපරාධ රැසක් අනාවරණය කරගෙන ඒවාට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කර ඇති මෙහෙය අතිවිශාලය.

ඒ හෙළිදරව් කිරීම් ජාත්‍යන්තර වශයෙන් රටට යහපතක් ගෙනැවිත් තිබෙයි. ඇමරිකන් රජය පවා ශ්‍රී ලංකාවට සහාය පළ කිරීමට ඉදිරිපත්ව සිටින්නේ ශ්‍රී ලංකාව තුළ නැවත නීතිය හා සාමය උදාවෙමින් තිබෙන නිසාය.

ප්‍රදීප් එක්නැලිගොඩ ඝාතනය සියලු සැකකරුවන් නීතියේ රැහැනට ගෙන ඔවුන්ට නිසි දඬුවම් ලබාදිය යුතුය.

ඒ දිනය උදාවනතුරු එක්නැලිගොඩ බිරිඳ මෙන්ම නීතිගරුක රටවැසියන් ද බලාසිටියි.

හේමන්ත රන්දුණු

Powered By -

සීමාසහිත උපාලි පුවත්පත් සමාගම
අංක 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13, ශ්‍රී ලංකාව.